# කැලණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

### වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර )-2012

2015 පෙබරවාරි

**BCOM E3054 - ජාත්‍යන්තර ආර්ථික විද්‍යාව**

ප්‍රශ්න සංඛ්‍යාව : 07 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

---

01. ශ්‍රී ලංකාව හා මැලේසියාව යන රටවල් දෙකම ඇඟළුම් හා රබර් නිෂ්පාදනය කරන බව සිතන්න. එක් එක් රට සඳහා ශ්‍රම පැයකට නිමවුම පහත වගුවේ දක්වා ඇත.

| රට | ඇඟළුම් (ඒකක) | රබර් (කි.ග්‍රෑ) |
|---|---|---|
| ශ්‍රී ලංකාව | 20 | 10 |
| මැලේසියාව | 25 | 12 |

එක් එක් රට සඳහා ශ්‍රම පැය 200 ක් ඇති බවඋපකල්පනය කරන්න.

අ. ඇඟළුම් කර්මාන්තය සඳහා ශ්‍රම පැය වලින් 50 % ක් ද ඉතිරිය රබර් කර්මාන්තය සඳහා භාවිතා කරයි නම් ශ්‍රී ලංකාවේ, මැලේසියාවේ හා සමස්ථ ලෝක නිෂ්පාදනය ගණනය කරන්න.

(ලකුණු 06)

ආ. ඇඟළුම් හා රබර් සඳහා නිරපේක්ෂ වාසිය ඇත්තේ කුමන රට කටද ?

(ලකුණු 03)

ඇ. ඇඟළුම් හා රබර් සඳහා සාපේක්ෂ වාසිය ඇත්තේ කුමන රටකට ද ? වෙළඳාම සිදුවන්නේ කෙසේද ?

(ලකුණු 05)

ඉ. සාපේක්ෂ වාසියට අනුව රටවල් එක් භාණ්ඩයකට පමණක් විශේෂීකරණය වූයේ නම් ලෝක නිෂ්පාදනය හා අන්තර්ජාතික වෙළඳාමේ වාසිය ගණනය කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

02. අ. පූර්ණ විශේෂීකරණය හා අසම්පූර්ණ විශේෂීකරණය යන පද වලින් කුමක් අදහස් වේද ? නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් භාවිතයෙන් විස්තරාත්මකව විදහා දක්වන්න.

(ලකුණු 10)

ආ. කිසියම් රටක් විසින් නිපදවන භාණ්ඩයක් ශ්‍රම සූක්ෂමද ? ප්‍රාග්ධන සූක්ෂමද යන්න ඔබ හඳුනාගන්නේ කෙසේ ද ?

(ලකුණු 04)

ඇ. රටක සාධක සුලබතාවය හඳුනාගන්නා විකල්ප ක්‍රම වේද පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

03. අ. ගෙවුම් ශේෂ ලේඛනය යන පදය කෙටියෙන් පැහැදිළි කරන්න.

(ලකුණු 04)

ආ. පහත ගණුදෙනු ඔබ සටහන් කරන්නේ ගෙවුම් ශේෂ ලේඛනයේ ඇතුලත් කවර ගිණුමේ ද ?

i. රබර් අපනයනය

ii. විදේශ සංචාරකයින් ශ්‍රී ලංකාව තුළ විදේශ මුදල් වියදම් කිරීම

iii. විදේශ රටකින් ණයක් ගැනීම

iv. ශ්‍රී ලංකා රජය විසින් බංගලාදේශය වෙත ගංවතුර සහනාධාර සැපයීම

(ලකුණු 04)

ඇ. කිසියම් රටක් තම නිෂ්පාදනයට වඩා වියදම් කරයි නම් ගෙවුම් ශේෂ ලේඛණයේ ඇති ප්‍රාග්ධන ගිණුමේ අතිරික්තයක් බිහි වේ. ඔබ එකඟ වන්නේ ද ? විස්තරාත්මකව විදහා දක්වන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

04. අ. විදේශ විනිමය සමපේක්ෂණය (Speculation) , අවදානම් රහිත ලාභ ඉපයීමෙන් ( Arbitration) වෙන් කොට දක්වන්න.

(ලකුණු 05)

ආ. ස්ථාවර විදේශ විනිමය අනුපාත ක්‍රමය , චල විදේශ විනිමය අනුපාත ක්‍රමයෙන් වෙන් කොට දක්වන්න.

(ලකුණු 05)

ඈ. ඉදිරි විනිමය ගිවිසුමක් යන්න හා එහි භාවිතය පැහැදිළි කරන්න.

(ලකුණු 05)

ඉ. ඇමරිකානු ඩොලරයට සාපෙක්ෂව ශ්‍රී ලංකාවේ රුපියල අවප්‍රමාණය වූයේ නම්, ඉන් ශ්‍රී ලංකා ආර්ථිකයට කවර බලපෑමක් සිදුවේද ?

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

05. අ. නිදහස් වෙළඳාමක් සඳහා ඇති විවිධ බාධක මොනවාදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ආ. පහත දැක්වෙන ආර්ථික සහයෝගීතාවයන් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

i. ආර්ථික කලාප (Economic Unions )

ii. වරණීය වෙළඳ ගිවිසුම් ( preferential trade agreement )

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

06. ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික වෙළඳාම ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලංකා රජයට ක්‍රියාත්මක කළ හැකි ප්‍රතිපත්ති යෝජනා කරන්න.

(මුළු ලකුණු 20)

07. පහත දෑ සඳහා කෙටි සටහන් ලියන්න.

අ. ප්‍රපාතනය

ආ. ලෝක ආර්ථික අවපාතය

ඈ. ගෝලීය කරණය

ඉ. ඛණිජ තෙල් මිල මත ඇති ආනයන බදු අඩුකිරීමේ ආර්ථික ප්‍රතිවිපාක

( ලකුණු 05 බැගින් )

(මුළු ලකුණු 20)